# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,490 - 2026 මැයි මස 22 සිකුරාදා - 2026.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු අ◌ැබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 800 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 800 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූනි මස 12 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 29 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


799 - B 082795 — (2026/05)
F 1 -

## පළාත් පාලන නිවේදන

### දික්වැල්ල ප්‍රාදේශීය සභාව

2026.01.20 දින මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 5.1.4 දරන සභා යෝජනාව පරිදි මාර්ගයේ එක් පසකට රථ වාහන ගමන් කිරීම

261 වන අධිකාරය වන 1952 අක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1893 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්* පත්‍රයේ පළ කර ප්‍රසිද්ධියට පත් කර, දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගන්නා ලද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කෙටුම්පත් කර ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 1811 හා 2013 මැයි 17 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ වාහන නතර කිරීම හා හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් මාර්ගය පහත වේලාවන්හි එක් පසකට රථ වාහන ගමන් කරවීම කරනු ලබන බව මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

| *අනු. අංකය* | *විස්තරය* | *ධාවනය වන වේලාව* |
|---|---|---|
| 01 | හිරිකැටිය හන්දියේ සිට පෙහෙඹිය දක්වා වාහන එක් පසකට පමණක් ධාවනය කිරීම | පෙ. ව. 9.00 සිට ප.ව. 10.00 දක්වා |

රුවන් වික්‍රමආරච්චි,<br>
සභාපති,<br>
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 08 දින,<br>
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-275

---

## විවිධ දැන්වීම්

### දික්වැල්ල ප්‍රාදේශීය සභාව

වෙළඳ වාහන මගින් ගාස්තු අය කිරීම සංශෝධනය කිරීම

දික්වැල්ල ප්‍රා දේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 19 දින පවත්වන ලද මහ සභාවේ තීරණ අංක 5.1.17 යටතේ 2025.11.07 දිනැති අංක 2462 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්* පත්‍රයේ IV(ආ) මගින් ප්‍රකාශයට පත් කරන ලද 2026 වර්ෂයේ ආදායම් *ගැසට්* නිවේදනයේ 2026 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීමට අදාළව අනු අංක 17 යටතේ වෙළඳ වාහන මගින් ගාස්තු අය කිරීම සඳහා පනවන ලද ගාස්තුව 2026.03.17 දින මහ සභාවේ තීරණ අංක 5.11.6 මගින් සංශෝධනය කර පහත සඳහන් නව ගාස්තු ක්‍රියාත්මක කරන බව මෙයින් දන්වා සිටිමි.

1. වෑන් රථයක් සඳහා - රු. 100.00
2. ලොරි රථයක් සඳහා - රු. 150.00

රුවන් වික්‍රමආරච්චි,<br>
සභාපති,<br>
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 08 දින,<br>
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-240

## වවුනියාව මහා නගර සභාව

### කළමනාකරණ කමිටු රැස්වීම - තීරණ අංක 01

වවුනියාව මහනගර සභාවට අයත් මාර්ග භාවිතා කර පහත සඳහන් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු නියම කර ඒවා *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණය කරන ලදී :

| *අංක* | *ද්‍රව්‍ය/භාණ්ඩ* | *නියමිත ගාස්තුව රු. ශත* | *මිනුම* |
|---|---|---|---|
| 01 | ග්‍රැනයිට් (කළු ගල්) | 250.00 | 01 කියුබ් |
| 02 | බොරළු | 250.00 | 01 කියුබ් |
| 03 | වැලි | 500.00 | 01 කියුබ් |
| 04 | පස් (කැණීම් පස්) | 500.00 | 01 කියුබ් |
| 05 | වැව් රොන්මඩ/මැටි | 100.00 | 01 කියුබ් |

සිවරංජිනී සිවසෙල්වන්,
කොමසාරිස්,
මහනගර සභාව,
වවුනියාව.

05-287

---

## කුරුණෑගල මහා නගර සභාව

### කුරුණෑගල මහා නගර සභාව තුළ 2026 වර්ෂය සඳහා ආදායම් උත්පාදනයන්

කුරුණෑගල මහා නගර සභාව විසින් 2026.03.16 දින පවත්වන ලද මහා සභා සම්මුති අංක GC/06/40/2026/03/16/MCK/HD/08 යටතේ 2026.05.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද ඇන්ටන් සහබන්දු,
නගරාධිපති,
කුරුණෑගල මහා නගර සභාව.

2026 අප්‍රේල් මස 30 දින,
කුරුණෑගල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**භූමදාන ගාස්තු අය කිරීම**

| *අනු. අංකය* | *කාරණය* | *සේවා ගාස්තුව (රු. ශත)* | *සුසාන භූමි ගාස්තුව (රු. ශත)* | *මුළු ගාස්තුව රු. ශත* |
|---|---|---|---|---|
| 12.7 | ස්ථිර වෙන්කර ගත් පවුලේ සොහොන් ගැබක් විවෘත කර තැන්පත් කිරීමට හෝ මිහිදන් කිරීමට (ජාති ආගම් නොසැලකේ.) නාගරික සීමාවෙන් පිටත | 1,000.00 | 11,000.00 | 12,000.00 |

05-241

## අක්මීමන ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා මාර්ග පළුදු කිරීම සහ සේවා ගාස්තු අය කිරීම

අක්මීමන ප්‍රාදේශීය සභාවේ 2026.05.08 දින පැවති මහා සභා රැස්වීමේ යෝජනා අංක 06.01.01 යටතේ පහත යෝජනාව සභා සම්මත වූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එච්. සුගත් ආනන්ද,
සභාපති,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

2025 මැයි මස 04 දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අක්මීමන ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන අත්‍යාවශ්‍ය සේවාවක් වන ජල ව්‍යාපෘතිවල සේවාව පාරිභෝගිකයන් වෙත අඛණ්ඩව සැපයීම සඳහා එම ව්‍යාපෘති ලාභ/පාඩු නොලබන මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා 2025.11.21 දිනැති අංක 2,464 දරන *ගැසට් පත්‍රය* මගින් 2026 වර්ෂය සඳහා පනවා ඇති ජල ගාස්තු 2026.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත ඒකක හා ගාස්තු අනුව සංශෝධනය කර අය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| *ඒකක ගණන* | *පරිහරණ ගාස්තුව* | *මාසික සේවා ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* |
| 00-05 | 50 | 300.00 |
| 06-10 | 70 | 300.00 |
| 11-15 | 90 | 300.00 |
| 16-20 | 100.00 | 400.00 |
| 21-25 | 120.00 | 500.00 |
| 26-30 | 150.00 | 600.00 |
| 31-40 | 170.00 | 1,500.00 |
| 41-50 | 195.00 | 3,000.00 |
| 51-75 | 225.00 | 3,500.00 |
| 76-100 | 250.00 | 4,000.00 |
| 100ට වැඩි | 280.00 | 4,500.00 |

05-321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.